# 05. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන් යටතට පැමිණීම.

ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසය තුල 16 වන සියවස දක්වා විදේශීය බලපෑම් මෙරටට එල්ල වූයේ අසල්වැසි ආසියාතික රටවලිනි. එහෙත් 16 වන සියවසේ සිට පෘතුගීසි , ලන්දේසි සහ ඉංග්‍රීසි යන යුරෝපා ජාතිකයන් පිළිවෙලින් මෙරටට පැමිණ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කළහ.

## පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන්.

| මව් රට | ජාතිය | පෙරදිග මධ්‍යස්ථානය |
|---|---|---|
| පෘතුගාලය | පෘතුගීසීන් | ගෝව |
| ඕලන්දය | ලන්දේසීන් | බතාවිය |
| ප්‍රංශය | ප්‍රංශ ජාතිකයන් | පොන්ඩිචෙරි |
| බ්‍රිතාන්‍ය | ඉංග්‍රීසීන් | කල්කටා/ මදුරාසි/ බොම්බාය |

## පෘතුගීසීන්ගේ අවධානය ශ්‍රී ලංකාවට යොමුවීම.

- පෘතුගීසි ජාතික වස්කෝද ගාමා ඉන්දියාවට පැමිණ වැඩිකල් යාමට පෙර ශ්‍රී ලංකාව පිළිබඳව පෘතුගීසීන්ට යම් යම් කරුණු දැන ගැනීමට ලැබුණි.

- පෘතුගීසීන් මේ වනවිට ශ්‍රී ලංකාව හැඳින්වූයේ "සෙයිලන්" යන නාමයෙනි.

- ශ්‍රී ලංකාවේ ඉතා හොඳ කුරුඳු වැවෙන බව ඔවුහු මේ වනවිට දැන සිටියහ.

- මේ අවධියේ යුරෝපා වෙළඳපොළේ කුරුඳු වැනි කුළුබඩු වලට ඉහල ඉල්ලුමක් පැවති බැවින් ශ්‍රී ලංකාව කෙරෙහි පෘතුගීසීන්ගේ අවධානය යොමු වී තිබිණ.

## ලොරෙන්සෝ ද අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණීම.

- පෘතුගාලයේ රජු 1505 වර්ෂයේදී පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා වශයෙන් “ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා” පත්කරන ලදී.

- එහිදී “සෙයිලන්” දූපත සොයා ගතයුතු යයි පෘතුගාල රජු විසින් අල්මේදාට උපදෙස් ලබාදී ඇත.

- මෙසේ පෘතුගීසීන් ශ්‍රී ලංකාව සමඟ සබඳතා ඇතිකර ගැනීමට උත්සාහ දරමින් සිටියහ.

- මේ අතර ඉන්දියන් සාගරයේ යාත්‍රා කරන මුස්ලිම් වෙළඳ නැව් අල්ලා ගැනීමේ මෙහෙයුමක යෙදී සිටි ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා නැමති පෘතුගීසි සෙන්පතියා ඇතුළු පිරිස ඉන්දියන් සාගරයේ වෙළඳ බලය ලබා ගන්නා ලදී.

- වෙළඳ බලය ලබා ගැනීම සඳහා ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා විසින් තම පුත් ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු කණ්ඩායමක් මාලදිවයිනට යවන ලදී.

ලොරෙන්සෝ ද අල්මේදා




- එම නැව් කණ්ඩායම කුණාටුවකට හසුවීමෙන් ගසාගෙන ගොස් ගාලු වරායට සේන්දු විය.

- පෘතුගීසි ජාතිකයෙක් වූ ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු කණ්ඩායම 1505 වර්ෂයේදී ගාලු වරායෙන් ශ්‍රී ලංකාවට අහම්බෙන් ගොඩ බැසීමත් සමඟ මෙය ශ්‍රී ලංකාව බව දැනගත් විට ඉමහත් ප්‍රීතියට පත්විය.

<u>ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු</u>

- රජතුමා බැහැදැක තමන්ට අවශ්‍ය වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්

ලොරෙන්සෝ ද අල්මේදා 1505 වර්ෂයේදී කොළඹට ලඟාවිය.

- පෘතුගීසීන්ගේ පැමිණීමෙන් කලබලයට පත්වූ මුස්ලිම්වරු ඔවුන්ට පහරදී එලවා දැමීමට තැත් කළහ.

- පෘතුගීසීන් තම නැව්වල සවිකොට තිබූ
- කාලතුවක්කු වලින් වෙඩිහඬ නිකුත් කොට මුස්ලිම්වරුන් පසුබැස්සවීමට සමත් විය.

- කිසිදා වෙඩිහඬ අසා නොතිබූ සිංහලයෝ ඉමහත් භීතියට හා පුදුමයට පත්වී වහාම රජතුමාට තොරතුරු දැන්වීය.
- එය රාජාවලියේ මෙසේ සඳහන් වේ.

රාජාවලියට අනුව බියට පත් වූ රට වැසියන් විසින් පෘතුගීසීහු මෙසේ හඳුන්වන ලදහ. “අපගේ කොළොම්තොටට ඉතා සුදු පැහැති මනුෂ්‍ය ජාතියක් පැමිණ සිටිති. යකඩ හැට්ට ඇඟලා යකඩ තොප්පි පැලඳගෙන විගස එකතැන නො සිට ගමන් කරත්නෝ ය. සුදු ගල් සපා කමින් ලේ බොන්නෝය ..... ඔවුන්ගේ තුවක්කු ගච් ගණන් ගොසින් වන් කල යුගන්ධර පර්වතය පවා පොඩි වන්නේය.” (රාජාවලිය)

**ක්‍රියාකාරකම - සිතියම 5.1 ඇසුරු කර ගනිමින් 16 වන සියවසේ මුල් කාලයේ ශ්‍රී ලංකාව සිතියමක දක්වන්න.**

**සැකසුම - ලලනි මොහොට්ටි මිය.**